කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය, 2016/2017

**INR 2228: සාමයගොඩනැඟීම: න්‍යාය සහ සංකල්ප**

කාලය: **පැය දෙකයි (02)**

ඕනෑම **ප්‍රශ්න තුනකට (03)** පිළිතුරු සපයන්න.

---

1. "සාමයගොඩනැඟීම (Peacebuilding) සැමවිටම දේශපාලනික නොවන අතර සමාජ-ආර්ථිකමයද වේ". සාකච්ඡා කරන්න. (ලකුණු 20)

2. කොටස් **දෙකටම (02)** පිළිතුරු සපයන්න.
   i. එක්සත් ජාතීන් විසින් 'සාමය සඳහා න්‍යාය පත්‍රයක්' (Agenda for Peace) සම්මත කරගැනීමට හේතු විස්තර කරන්න. (ලකුණු 08)
   ii. 'සාමය සඳහා න්‍යාය පත්‍රයේ' (Agenda for Peace) ප්‍රධාන අපේක්ෂාවන් සංක්ෂිප්තව දක්වන්න. (ලකුණු 12)

3. **එක්කෝ**

   1. "තිරසාර සාමය ගොඩනැඟීම සඳහා පෘථුල ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමට ගැටුම පිළිබඳ ගැඹුරු අවබෝධයක් අවශ්‍ය වේ". ශ්‍රී ලංකාවේ පශ්චාත් සාමයගොඩනැඟීමේ ව්‍යාපෘතිය ඇසුරෙන් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න. (ලකුණු 20)

   **නැත්නම්**

   2. කොටස් **දෙකටම (02)** පිළිතුරු සපයන්න.

   i. ලිබරල් සාම න්‍යායේ (Liberal Peace Theory) ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10)
   ii. ලිබරල් සාම න්‍යායට එදිරිව එල්ල වී ඇති ප්‍රධාන විවේචන සංක්ෂිප්තව දක්වන්න. (ලකුණු 10)

4. සාමයගොඩනැඟීමේ නියැලි සිටින විවිධ පාත්‍රයන් පිළිබඳ රචනයක් ලියන්න. (ලකුණු 20)

5. කොටස් **දෙකටම (02)** පිළිතුරු සපයන්න.
   i. උදාහරණ සපයමින් සාමයගොඩනැඟීමේ ව්‍යාපෘතියක් තුළ ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් සාකච්ඡා කරන්න. (ලකුණු 06)
   ii. ගැටුම් විපරිවර්තනය (Conflict Transformation) උදෙසා එක්සත් ජාතීන්ගේ කාර්යභාරය අගයන්න. (ලකුණු 14)

6. "අවම සම්බන්ධීකරණය සහ මූල්‍යමය බාධාවන්, සාමය සඳහා න්‍යාය පත්‍රය (Agenda for Peace) නැවත සලකා බැලීමකට යොමු කළේය". බ්‍රහිමි වාර්තාවෙහි (Brahimi Report) අදාල කොටස් යොදා ගනිමින් ඉහත ප්‍රකාශය පිළිබඳ වාර්තාවක් ලියන්න. (ලකුණු 20)

********************